සන්නස සුභසාදණ
Marriage Proposals

මනාලියෝ

Sinhala Buddhist parents seek a professionally qualified son for our 29 year old daughter. She is working in an International Medical Diagnostics Company as an Application Specialist & Accounts Manager. Our daughter is a very caring person with lot of respect for family values.

Please reply to
lalithaw07@gmail.com

NSMP 365

We are Govi/Buddhist Sinhalese, Dual Citizen Australia/NZ seeking a professionally qualified son (Australian or NZ citizen) for our daughter 28 years, graduated in science from monash University Melbourne. To
myesimart@gmail.com

NSMP 362

Sinhala Christian Australian Citizen lives in Victoria divorce Childs custody with inlaws age 44 height 5 2" tall kind hearted, seeks kind hearted partner Profession Age Care worker and Account Assistant Respond details with recent photo to
namalproposal@gmail.com

NSMP 364

සන්නස මංගල යෝජනා

මුල් වචන 40 සඳහා මාසයකට අයකිරීම ඩොලර් 30 පහත දැක්වෙන ගිණුමට මුදල් බැර කර එම ලදු පත සමග ඔබේ දැන්වීම අපට එවන්න

Account Name:
Sannasa Media Group
Bank: **Westpac**
BSB: **033137**
Account No: **626689**

info@sannasa.com.au

මනාලයෝ

ඔස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලත් ශ්‍රී ලංකාවේ වෙසෙන පදිංචි කඩවසම්පුතුට (සමාගම් අධ්‍යක්ෂ) සුදුසු සහකාරියක් මව සොයයි (උස 5' 7'' උපන් දිනය 1980 අප්‍රේල්) අමතන්න 0416 223 672
ලිපිනය 9/109 බෙරිඩේල් පාර බෙරිඩේල් තස්මේනියා 7011

NSMP 366

බොදු ගොවි 1981ල උස 5' 10'' පැහැපත් කඩවසම් කොළඹ රාජකීයයේ උගත් කොළඹ විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි HR ඩිප්ලෝමාධාරී රජයේ ස්ථිර රැකියාවැති පුතුට ඔස්ට්‍රේලියාවේ පදිංචි පරිගණක ඉංජිනේරු සොහොයුරෙක් සහ කථාර්හි ගණකාධිකාරිවරයකු හා විවාහක සොහොයුරියක් සිටිති. සුදුසු සහකාරියක සොයන්නේ බැංකුසංස්ථා කළමණාකාර විශ්‍රාමික දෙමාපියන්ය.

දුරකතන 011 2517510 හෝ
+61438038624
මොබයිල් 0714496008

NSMP 363

කියලුම ජ්‍යෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම පලාපල ලියාදීම කරදර ගැටළු වලට පිළියම් අපල වලට පිළියම් විවාහ සීඝ්‍රම් පොරොන්දම් ගැලපීම දෝෂ විමසීම හා මගහරවා ගැනීමට උපදෙස් මංගල මල්වර නිවාස විභාග අකුරු කරවීමේ ශුභ නැකත්නමට අකුරු නම් තැබීම දල සිරිපති ක්‍රිණ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු

ඊමේල් දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා
රහස්‍යභාවය සුරකිමු

සුබෝධා ජ්‍යෝතිශ්‍ය සේවය
www.wix.com/eppingvic/subodhabeauty
0433 536 097 subodhaastro@yahoo.com.au

මහින්ද ගුණවර්ධන

ජපන් රණ ශූර ෂින්ගෙන්ගේ මිනිබිරියක වූ සුප්‍රසිද්ධ රියොනන් භික්ෂුණිය උපන්නේ 1797 දී. ඇය අතිශයින් රූමත්. ඉතා දක්ෂ කිවිඳියක්. අධිරාජිනියගේ කිට්ටුවන්ත සේවිකාවක්. ඇය යොවුන් වියට පත්වීමත් සමග ම ඇයට ප්‍රසිද්ධිය ද ලැබුණා.

හදිසියේ ම අධිරාජිනිය මිය ගියා. රියොනන්ගේ සිහින බිඳ වැටුණා. ජීවිතයේ අනියත බව දැනුණා. ඇය සෙන් ඉගෙන ගැනීමට තීරණය කළා. එහෙත් ඇගේ දෙමාපියන් ඊට විරුද්ධ වුණා. ඇය විවාහයකට පෙළඹෙව්වා. එහෙත් ඇය කොන්දේසියක් ඉදිරිපත් කළා. දරුවන් තුන් දෙනෙක් වැදූ පසු ඇය භික්ෂුණියක් වන බවට. ඇයට වයස අවුරුදු විසි පහ වන්නට පෙර ඇය දරුවන් තුන් දෙනෙක් ප්‍රසූත කළා. ඇගේ සැමියාට හා ඥාතීන්ට ඇගේ අරමුණට එකඟ වන්නට සිදු වුණා.

එඩො පුරවරයට පැමිණි ඇය හිස මුඩු කළා. නම රියොනන් දෙස වෙනස් කළා. ටෙට්සුග්යා ගුරුතුමා වෙත ගියා. ඇය දුටු සැනින් ගුරුතුමා ඇයට ශිෂ්‍යභාවය ලබා දීම ප්‍රතික්ෂේප කළා. හිස මුඩු කළ ද ඇය බෙහෙවින් රූමත් නිසා.

ඊළඟට ඇය හකුවො ගුරුතුමා මුණ ගැසුණා. ඇගේ රූපය ප්‍රශ්න ඇති කළ හැකි බැවින් බාර ගැනීමට නො හැකි බව හකුවො කීවා.

රියොනන් ගිනියම් යකඩයක් මුහුණේ තබා ගත්තා. සුළු මෙහොතකින් ඇගේ ලස්සන සදාකාලයට ම අහෝසි වුණා. ඊට පස්සේ හකුවො ඇය අනුගාමිකයකු බවට පත් කර ගත්තා.

ඇය මුහුණ බලන කුඩා කන්නාඩියක පිටුපස කවියක් ලිව්වා.

මගේ ම වටිනා සළු පිළි විලවුන් සුවඳින්
පොඟවාලන්නට
සුවඳ දැල්ලුවා මං අධිරාජිනියගෙ ඇසුරෙ
ඉන්නකොට
සෙන් පන්සලට යි යන්නේ තැන තැන
ඇවිදින මෙහෙණියක් ලෙසින්
පුච්චන්නට මට සිද්ධ වෙලා අවසර
ගන්නට මුහුණ මගේ

රියොනන් මිය යන්නට ආසන්න අවස්ථාවේ ඇය තවත් කවියක් ලිව්වා.

මගේ ම දෑසින් දැකගන්නා
හැට හය සැරයක් සරත් සමේ
සඳ ගැන කිව්වා
ඕනෑ තරම් මම

දේවදාර හා පයින්වලින් එන
හඬ අහගෙන ඉන්නම්
නිහඬ සුළං සමයේ
නෑ ඉල්ලන්නේ
අන් කිසිවක් මම

බුදු දහමේ පෙන්වා දෙන දුකෙන් මිදීම හෙවත් 'නිවන් දැකීම' පිළිබඳ බොහෝ දෙනෙකු තුළ මහත් උනන්දුවක් දැක්නට ලැබුණද ඒ සඳහා වන මාර්ගය හෙවත් ප්‍රතිපදාව සම්බන්ධයෙන් පවතින්නේ යම් පමණක වියාකූළභාවයකි. සෘජුවම නිවන් මඟ පෙන්වා දෙන මාර්ගෝපදේශනා අසන්නට බෞද්ධයන්ට පවා ලැබෙන අවස්ථාවන් වර්තමානයේද බෙහෙවින් සීමිතය. ලබුණෝරුවකන්ද ආරණ්‍යයේ දීර්ඝ කාලයක් තිස්සේ භාවනුයෝගීව වැඩ වෙසෙන පූජ්‍ය මාන්කඩවල සුදස්සන ස්වාමීන්වහන්සේ ඍජුවම නිවන් මඟ පිළිබඳ මාර්ගෝපදේශනා පවත්වන ශ්‍රී ලංකාවාසී බෞද්ධ භික්ෂූන්වහන්සේලා කිහිප දෙනා අතර ප්‍රමුඛ මහතෙර නමකි. එහිමියෙන් විසින් පවත්වන ලද විශේෂ පුහුණු වැඩසටහනකදී සිදු කළ ධර්ම දේශනාවන් ඇතුළත් මේ ලිපි පෙළ නිවන් දකිනු රිසි 'සන්නස' පාඨකයන්ගේ අර්ථ සිද්ධිය වෙනුවෙනි.

ලෝකය හටගැනීම සහ දුරු කිරීම

පූජ්‍ය
මාන්කඩවල සුදස්සන
ස්වාමීන්වහන්සේ

නිවුන් සහෝදරයන් සමාන වන්නාක් මෙන් ස්කන්ධ සහ පංචඋපාධානාක්ඛන්ධ දෙකේ ලක්ෂණ සමානය. එහෙත් ඒ දෙකේ සැබෑ ස්වභාවය අපි හඳුනන්නේ නැත්නම් දුක නිරුද්ධ කිරීම (නිවන් දැකීම) හෝ ආර්ය අෂ්ඨාංගික මාර්ගය (නිවන් මඟ) වැඩීමේ ධර්මතාව සිදු නොවන්නේය. එබැවින් මුලින්ම අප 'ස්කන්ධ' සහ 'උපාධානස්ඛන්ධ'වල ලක්ෂණ සහ වෙනස්කම් පැහැදිලිව තේරුම්ගත යුතුය. ඒ වෙනස්කම් හඳුනාගැනීමට හැකිවන්නේ ස්කන්ධයෝ සහ පංචඋපාධානස්ඛන්ධයෝ ඇතිවීමට මුල් වූ හේතු ප්‍රත්‍යයන් පිරික්ෂා බැලීමෙනි.
ස්කන්ධ යනු සෘජු විටම පෙර අවිද්‍යා කථනයට හටගත් වර්තමාන විපාක වූ ස්පර්ශ ආයතන හයත් එම ආයතනවලට ප්‍රකෘතියෙන් ගැටෙන රූපාදී අරමුණුත්ය. ස්කන්ධවල රූපය සෘජු විටම සෑදී ඇත්තේ සතර මහා ධාතූන්ගෙනි. ස්ඛන්ධවල වේදනා, සංඥා, සංකාර යන චෛතසික සෘජු විටම සෑදී ඇත්තේ ස්පර්ශ ප්‍රත්‍යයෙනි. ස්ඛන්ධවල විඤ්ඤාණය සෑදී ඇත්තේ සෘජු විටම නාමරූප ප්‍රත්‍යයෙනි. එනම් ස්ඛන්ධ සෘජු විටම සෑදී ඇත්තේ ආහාර ප්‍රත්‍යයෙනි. එහෙත් පංචඋපාධානස්ඛන්ධයේ රූපයද, වේදනාවද, සංඥාවද, සංකාර සහ විඤ්ඤාණය ද යන සියල්ලම සෑදී ඇත්තේ තණ්හා ප්‍රත්‍යයෙනි.
කන බොන ආහාරයෙන් සැදුණු, පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා ධාතුවෙන් යුක්ත රූපයක් ඇසුරු කොටගෙන ඇති වර්ණ සහ හැඩතල සටහනක් පෙනීම රූපයක් දැකීම වශයෙන් අපි හඳුනාගන්නෙමු. මේ ආකාරයෙන් රූප දැකීම කෙළෙස් ඇති නැති කාටත් එකසේ සිදුවේ. මෙය පෙනීමයි.
මේ පෙනීම යන සිදුවීම තුළ රාග, ද්වේෂ, මෝහ (ඇතැසල් මුල්) කිසිත් නැත. නමුත් දකින්නා තුළ මේ පෙනෙන අරමුණේ (රූපයේ) අත්ත ඇති සැටියෙන් නොදන්නා කම (අවිද්‍යාව) හෝ ඡන්ද රාගය (තණ්හාව) තිබුණොත් ඇතිවන දෝෂය වන්නේ ඒ රූපය දැකීමෙන් පසුව දකින්නා පැත්තකට ගියද මේ දැකපු දේ, දැකපු සිද්ධිය හෝ දැකපු කෙනා එහෙම පිටින්ම මනසේ රැඳීමය. එවිට අපට දැකපු දේ පසු අවස්ථාවකදී එලෙසින්ම නැවත සිහිකිරීමේ හැකියාවක් ඇතිවේ. 'උපාධානස්ඛන්ධය' යනුවෙන් හැඳින්වෙන්නේ එලෙස සිහිකළ හැකි දෙයයි. එනම් මුලින් දුටු දෙය නොව ඒ දුටු දෙයෙහි ඒ අවස්ථාවේ වූ වර්ණ සහ හැඩතල සටහනයි. එලෙස සිහිකළ හැක්කේ රූපයක් වන විට එයට රූප උපාධානක්ඛන්ධය යැයි කියයි. එලෙස සිහිකළ හැක්කේ වේදනාවක් නම් එය වේදනා උපාධානක්ඛන්ධය යි. පංච උපාධානක්ඛන්ධය පැනවෙන්නේ ඒ ආකාරයෙනි. ඇස් ඉදිරිපිටට හමුවන රූපය රූපස්කන්ධයයි. එය බාහිර ලෝකයේ පවතින්නකි. එහි කෙළෙස් කිසිවක් නැත. එහෙත් එම රූපය හඳුනාගන්නා තුළ අවිද්‍යාව ශේෂයක් නෝ තිබුණොත් හෝ අරමුණ රසවිඳගැනීමේ තණ්හාව ශේෂයක් හෝ තිබුණ හොත් (අවිජ්ජාභව තණ්හා) දෝෂයක් ඇතිවේ. ඒ දෝෂය නම් ඇසට ගැටුණු රූපය ගැටුණු වහාම ඉතිරි නැතිව නිරුද්ධ වෙද්දී එය මනස තුළ නැවත ඒ ආකාරයෙන්ම සිහිපත් කළ හැකි මට්ටමකින් ඇතිවීමය.
ඔබගේ සිතේ දැනටත් ඇති අම්මා, තාත්තා, නංගි, මල්ලි ආදී වශයෙන් වන නැවත සිහි පත් කළ හැකි අතීත රූප යම් ප්‍රමාණයක් වන්නේද, ඒ රූපවලට රූප උපාධානස්ඛන්ධය යැයි කියයි. ඒ ආකාරයෙන්ම ඔබට නැවත සිහිපත් කළ හැකි අතීතයේ විඳි යම් වේදනාවන් යම් ප්‍රමාණයක් වේද ඒවාට වේදනා උපාධානස්ඛන්ධය යැයි කියයි. දුටු රූපයක හෝ ශබ්දයක හැඩය සිහිපත් කළ හැකි වන්නේද එයට සංඥා උපාධානස්ඛන්ධය යැයි කියයි. රූපය, ගන්ධය, රසය පිළිබඳ ඔබ සිතපු දෙයක් නැවත සිහිපත් කළ හැකි වන්නේද එයට සංස්කාර උපාධානස්ඛන්ධය යැයි කියයි. රූප, ශබ්ද, ගන්ධ ආදිය දැනගත් බව සිහිපත් කළ හැකිවන්නේද එයට විඤ්ඤාණ උපාධානස්ඛන්ධය යැයි කියයි.
මේ පංච උපාධානස්ඛන්ධයම සෘජු ඇත්තේ කෙළේසයකිනි.
ඇස් ඉදිරිපිටට ආ රූපස්කන්ධය (රූපය) සෘජු ඇත්තේ ආහාර ප්‍රත්‍යයෙනි. වේදනා, සංඥා, චේතනා සෘජු ඇත්තේ ස්පර්ශ ප්‍රත්‍යයෙනි. 'විඤ්ඤාණ' හෙවත් රූපය ගැන යම් දැනීමක් වී නම් එය නාම රූප ප්‍රත්‍යයෙනි. එලෙසින් ඒ ඒ ස්කන්ධවලට වෙන වෙනම ආහාර ප්‍රත්‍යයක් තිබේ. ඒ ආහාර නිරුද්ධ වන විට ස්කන්ධ ටිකද ඉතිරි නැතිවම නිරුද්ධ වේ.
නමුත් පංච උපාධානස්ඛන්ධයට ඇත්තේ එක් ප්‍රත්‍යයකි. එහි ස්කන්ධ පංචකයම ඇතිවී ඇත්තේ අවිද්‍යාභව තණ්හා යන කෙලේස මුල්වීමෙනි. ඔබ යමෙක් පිළිබඳ සිහිකරන විට සිහිකරන කෙනාමයි පෙර දුටු වේ කියා සිතයි. දැකපු දේමයි සිහිකරන්නේ කියා සිතයි. මනසේ ඇති ගතිය පෙනෙන දේට බඳිනතාක්, පෙනෙන දේ මනසින් සිහි කරන්නට පුළුවන්තාක් ඔබත් අපත් මේ ලෝකයට බැඳී සිටිමු. නිවුන් සහෝදරයන් පහසුවෙන් වෙන්කොට හඳුනාගත නොහැකි වන්නාක් මෙහි. ඇසට පෙනෙන වර්ණ රූප සටහන පසුව වෙනත් තැනකදී ඒ ආකාරයෙන්ම නැවත මෙනෙහි කරගත හැකිය. ඒ දෙකේම වර්ණ රූප සටහන් බාහිරින් බැලූ විට එකිනෙකට සමානය. එබැවින් බාහිරින් පමණක් මේ දේවල් දකින්නා මේ දෙකම එකක් ලෙස ගැනීම සාමාන්‍ය තත්ත්වයකි. එහෙත් මේ දෙකෙහි වෙනසක් තිබේ. එය දැකිය හැක්ක් විශේෂයෙන් විමසා බලන්නේ නම් පමණකි. ඒ වෙනස නම් ඇස ඉදිරිපිටට පැමිණි රූපය අනාත්මය. එලෙස දැකීමෙන් පසුව සිහිකළ හැකි රූපය ආත්ම ය. සිහිකරන්නා සිහිකරන්නේ පුද්ගලයෙකු හෝ සත්ත්වයෙකු හෝ කෙනෙකු හෝ දෙයකි.
ඇහැට පෙනෙන රූපය හෝ ස්පර්ශයෙන් උපන්න වේදනා, සංඥා, චේතනා හෝ නාම රූප ප්‍රත්‍යයෙන් හටගන්නා විඤ්ඤාණය හෝ අරහයා අපට කළ හැකි කිසිවක්ම නැත. ප්‍රත්‍ය නිසා හටගත් එම ස්කන්ධයෝ ප්‍රත්‍ය නිරුද්ධ වීමෙන් නිරුද්ධවීම නියත වශයෙන්ම සිදුවන්නේය. සැබෑවටම සැම කල්හිම ඇස් ඉදිරිපිටට ආවේ අනාත්ම වූ, සත්ත්ව පුද්ගල නොවන, සතර මහා ධාතූන්ගෙන් සැදුණු රූප සටහනක්මය. එබඳු වූ රූප ස්පර්ශයකින් උපන් වේදනා වක්මය. එබඳු වූ සංඥාවක්මය. අපි සිතුවේ එබඳු වූ රූපයක් ගැනමය. මේ ස්කන්ධ පංචකයම අනාත්මය.
මේ ස්කන්ධ පිළිබඳ අෘත්ත නොදන්නාකම ඇතිවිට පංචඋපාධානස්ඛන්ධ ලෝකය සැදේ. දැකපු දේ නැවත සිහිකිරීමේ හැකියාව ලැබේ. එයට 'චක්ඛායතනයේ උපචය රූප' යැයි කියයි. දැකපු දේවල් රැස්වේ. නැවත සිහිකළ හැකිවන්නේ එලෙස රැස්වුණු දේවල් පමණි. බාහිර ලෝකයේ සැබෑ වශයෙන්ම පවතින්නාවූ එහෙත් උපාධාන වශයෙන් අපගේ සිත තුළ රැස් නොවුණු දේ අපට සිහිකළ නොහැකිය. රැස් නොවුණු දේවල්ද එලෙස සිහිපත් කළ හැකිවන්නේ නම් අපට නොදුටු දේවල්ද සිහි පත් කළ හැකි විය යුතුය. යමක් දකින්නට කලින්ද එය සිහිපත් කළ හැකි විය යුතුය. එහෙත් එසේ කළ නොහැකිය. නිදසුනකින් දක්වතොත් කිසිදා බුද්ධගයාව නොදුටු කෙනෙකුට බුද්ධගයාව සිහිපත් කළ හැකි නොවේ. බුද්ධගයාව සිහිපත් කළ හැක්කේ එකවරක් හෝ බුද්ධගයාව දැක ඇති අයෙකුට පමණකි. ඔබ බුද්ධගයාවට කිසිදා නොගිය අයෙකු නම් 'බුද්ධගයාව' යැයි කී විට ඔබට කිසිවක් සිහිපත් නො වේ. වචන මාත්‍රයකින් පමණක් එය ඇසේ. එහෙත් ඔබ බුද්ධගයාවට ගිය අයෙකු නම් 'බුද්ධගයාව' යැයි කියන විට ඒ පිළිබඳ පෙර මතකයක් නැවතා ඇතිවේ. එලෙස සිහි පත් කළ හැක්කේ කලින් දුටු දේ පමණකි. දැකපු දේ එක්වීමක් සිදුව ඇති බව එයින් පැහැදිලිවේ.
ඔබ හුදකලාව සිටින විට ඔබේ සිතට අම්මා, තාත්තා, අයියා, අක්කා ආදී වශයෙන් සත්ත්ව පුද්ගලභාවයෙන් යුක්ත සිහිවීම් රූප උපාධානස්ඛන්ධයයි. විදර්ශණාව යනු ඒ පිළිබඳ ඇතිකරගන්නා විශේෂ දැකීමයි. දුක ඇතිවන්නේ උපාධානස්ඛන්ධයෙනි. දුක නැති කිරීමට නම් උපාධානස්ඛන්ධය නැති කළ යුතුය. එය කළ හැක්කේ කෙසේද?
මේ රූප උපාධානස්ඛන්ධය පිළිනොගන්න. එය ඇත්තක් ලෙස නොගන්න. මෙය පිළිනොගෙන, ඇත්ත වෙන්නට ද නොදී ඒ රූපය දුරුකරන්න. ඒ රූපය අයින් කරන්න. ඒ රූපය බැහැර කරන්න. ඒ රූපය ගෙවා දමන්න. ඒ රූපය නැති කිරීමට උත්සාහවත් වෙන්න.
එය කළ හැකිවන්නේ මෙසේය. 'අම්මා' කියා සිහිවන විටම එය ඇත්ත කරගෙන ඒ පිළිබඳ කැමැත්ත අකමැත්ත ඇතිවන ආකාරයෙන් සිහිපත් කිරීමක් නොකර, ඒ රූපය පිළිනොගන්න. එය කන බොන ආහාරයෙන් සෑදුණු ඇස් ඉදිරිපිටට ආ රූපයක ස්වභාවය නොදන්නාකම නිසා තමන්ගේම සිතෙන් හදාගත්තා වූ රූපයක් බව සිහිකරන්න. 'අම්මා' කියා සිහිපත් වෙන්නේ පෙර දකින ලද්දා වූ රූපය ලෙස තීරණය නොකරන්න. මේ ආකාරයෙන් සියලු උපාධානස්ඛන්ධයන් සම්බන්ධයෙන් කටයුතු කරන විට නොබෝ දවසකින් කෙලෙස් ගෙවී යයි. ඒ සඳහා බොහෝ කාලයක් ගත නොවේ.
මෙලෙස උපාධානස්ඛන්ධ රූප ගෙවා දමන්නේ කෙසේද? බැහැර කරන්නේ කෙසේද? මෙසේය. උපාධාන රූපයට ප්‍රත්‍ය වූ පූර්වයෙහි ඇස් ඉදිරිපිටට පැමිණියා වූ රූපයේ යථා ස්වභාවය, සැබෑ ස්වභාවය පෙන්වා දෙන්න. ඇස් ඉදිරියට පැමිණි රූපය, කනබොන ආහාරයෙන් සැදුණු කෙස් ලොම් නිය දත් සම් මස් ඇට ඇති තැනෙක තියන වර්ණ සටහනක් බව පෙන්වා දෙන්න. එය රසවිඳගැනීමෙන් යුක්තව නැරඹීම නිසා සිතේ ඇතිවූ උපාධාන රූපයක් බව පෙන්වා දෙන්න. මෙලෙස සිහිපත් වන රූපය සැබෑවක් නොව පූර්වයෙහි එම රූපය දකින අවස්ථාවේ ප්‍රමාදයෙන් වාසය කිරීමේ දෝෂය නිසා සිතේ හදාගත් රූපයක් හෙවත් උපාධානස්කන්ධ රූපයක් බව පෙන්වා දෙන්න.
අපට ඇතිවන දුක පවතින්නේ මේ ආකාරයෙන් ගොඩනැඟී ඇති රූප, වේදනා, සංඥා, සංකාර, විඤ්ඤාණ යන පංච උපාධානස්ඛන්ධ ලෝකය තුළය. 'අනේ අපේ අම්මා කෑවද දන්නෑ.', 'අම්මට මොනව වුණාද දන් නෑ.', 'අනේ අපේ අම්මා ජීවත්ව ඉන්න කල් මෙහෙම උපකාර කළා. අනේ අපේ අම්මා මැරිලානේ.' කියමින් අවශ්‍ය නම් ඔබට ඕනෑතරම් අඬන්න වැළපෙන්නට ද පුළුවන්කම තිබේ. එසේ නොකර විදර්ශණා කිරීම මගින් ඇඩීමෙන් වැළපීමෙන් වැළකී සිටීමටද හැකියාව තිබේ. කළ යුත්තේ කුමක්දැයි යන තීරණය ඔබ සතුය.
ඔබගේ තීරණය සහ ක්‍රියාව කුමක් වුවද ඔබගේ හැඬීම වැළපීමට ප්‍රත්‍ය වූ 'අම්මා' යනු ආහාර ප්‍රත්‍යයෙන් හටගත් වර්ණ සටහන යථා ස්වභාවය නම් හටගෙන නිරුද්ධ වීමය. ඒ ස්වභාවය වෙනස් කිරීමට ඔබට හැකියාවක් නැත. ඔබට තබා ඔබේ අම්මාට හෝ ඒ ස්වභාවය වෙනස් කිරීමට හැකියාවක් නැත. ඒ ස්වභාවය වෙනස් කළ හැකි අන් කිසිවෙක් හෝ ලෝකයේ නැත.

ශ්‍රීලාල් සෙනෙවිරත්න